ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| 13 ශ්‍රේණිය | 45 S I | බෞද්ධ ශිෂ්ටාචාරය - I<br>Buddhist Civilization - I | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|

**උපදෙස් :**
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **01** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර** තෝරාගෙන එය පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. "ඒක දේවවාදී" ආගමික පිළිවෙත ක්‍රියාත්මක වූයේ,
(1) වේද යුගය තුළය. (2) බ්‍රාහ්මණ යුගය තුළය. (3) අරණ්‍යක යුගය තුළය.
(4) උපනිෂද් යුගය තුළය. (5) බෞද්ධ යුගය තුළය.

02. වෛදික සාහිත්‍යාගත නිර්මාණවාදී සංකල්පයට ඇතුළත් නොවන කුල නාම දෙකකි.
(1) ශාක්‍ය හා බ්‍රාහ්මණ
(2) ශාක්‍ය හා ක්ෂත්‍රිය
(3) ශාක්‍ය හා වෛශ්‍ය
(4) ශාක්‍ය හා ශුද්‍ර
(5) ශාක්‍ය හා කෝලිය

03. "ජන්මීය සාධක" පදනම් කරගෙන මානව වර්ගයා උසස් පහත් ලෙස වර්ගීකරණය කිරීම බුදුසමය ප්‍රතික්ෂේප කරයි. මෙය තහවුරු වන්නේ,
(1) ඓතිහාසික සාධකයෙනි.
(2) සමාජ විද්‍යාත්මක සාධකයෙනි.
(3) ජීව විද්‍යාත්මක සාධකයෙනි.
(4) ආචාර විද්‍යාත්මක සාධකයෙනි.
(5) මනෝ විද්‍යාත්මක සාධකයෙනි.

04. චතුර් වර්ණයෙන් ඉටුවිය යුතු කාර්ය කොටස් හෙවත් යුතුකම් ගැන පැවැසෙන්නේ,
(1) වර්ණ ධර්ම සංකල්පයෙනි. (2) ස්වධර්ම සංකල්පයෙනි. (3) ආපද් ධර්ම සංකල්පයෙනි.
(4) ආශ්‍රම ධර්ම සංකල්පයෙනි. (5) ඊශ්වර නිර්මාණවාදයෙනි.

05. බ්‍රාහ්මණාගමේ ඉගැන්වෙන ආපද්ධර්ම සංකල්පයට අනුව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(1) බ්‍රාහ්මණයා විසින් ක්ෂත්‍රියාට අයත් කාර්යයන් කළ හැකිය යන්නය.
(2) ක්ෂත්‍රියා විසින් බ්‍රාහ්මණයාට අයත් කාර්යයන් කළ හැකිය යන්නය.
(3) බ්‍රාහ්මණයා විසින් වෛශ්‍යයාට අයත් කාර්යයන් කළ හැකිය යන්නය.
(4) ක්ෂත්‍රියා විසින් වෛශ්‍යයාට අයත් කාර්යයන් කළ හැකිය යන්නය.
(5) වෛශ්‍යයා විසින් ශුද්‍රයාට අයත් කාර්යයන් කළ හැකිය යන්නය.

06. පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා යොමුවීම ආශ්‍රම ධර්මවල අවසාන අංග දෙකෙන් අවධාරණය කෙරේ. පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය බුදුසමය අගය කරන නමුත් බ්‍රාහ්මණ සම්ප්‍රදායට අයත් එම ඉගැන්වීම විචාරයට හා විවේචනයට ලක් කරයි. ඊට පදනම්ව ඇත්තේ,
(1) ආධ්‍යාත්මික සංවර්ධනය ඕනෑම කාලයක දී කළ නොහැකි වීමයි.
(2) ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කර ගැනීමට එයින් පුද්ගලයාට ප්‍රමාණවත් කාලයක් නොවීමයි.
(3) ආධ්‍යාත්මික සංවර්ධනයට පත්වීම වයසට පත් පුද්ගලයෙකුට දුෂ්කරවීමයි.
(4) ආධ්‍යාත්මික සංවර්ධනය සමාජයෙන් වියුක්තව සිදුකළ නොහැකි වීමයි.
(5) ආධ්‍යාත්මික සංවර්ධනය හුදෙකලාව සිදුකළ නොහැකි වීමයි.

07. බ්‍රාහ්මණ සංස්කෘතියේ ප්‍රමුඛ ආගමික සංචාර විධියක් වූ යාග කර්මයේ වේදපාඨ ගායනා කරන බමුණු පූජකවරයා හඳුන්වනු ලබන්නේ,

(1) හෝතෘ නමිනි.
(2) අධ්වරයු නමිනි.
(3) යාඥකාරක නමිනි.
(4) උද්ගාතෘ නමිනි.
(5) යජමානක නමිනි.

08. පහත සඳහන් ප්‍රකාශ අතුරින් බුද්ධකාලීන භාරතීය කාන්තාව පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් වලට අදාළ වඩාත්ම නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) ජීවිතාන්තය දක්වාම පුරුෂාධිපත්‍යයට යටත්ව වාසය කළ යුතුය.
(2) ස්වාමියා මළ පසුව සති පූජාව පැවැත්වීම අනිවාර්ය වීමය.
(3) කාන්තාවට ආගමික කටයුතුවලට සහභාගි වීමට හැකි වූයේ ස්වාමියා සමඟ පමණි.
(4) කාන්තාවට ප්‍රමාණවත් ආගමික නිදහසක් හිමි වීමය.
(5) විවාහයෙන් පසුව පිරිමි දරුවෙකු බිහි කිරීම අනිවාර්ය වීමය.

09. අධිගම ලාභයට ස්ත්‍රීත්වය බාධකයක් නොවන බව පැවැසෙන්නේ,

(1) බුදුරදුන් කොසොල් රජු සැනසීමට කළ ප්‍රකාශයෙනි.
(2) කුණ්ඩලකේශී පිළිබඳ කතා පුවතෙනි.
(3) සෝමා තෙරණිය පිළිබඳ කතා පුවතෙනි.
(4) දිට්ඨ මංගලිකා කතා පුවතෙනි.
(5) නකුල මාතා පිළිබඳ කතා පුවතෙනි.

10. පහත දැක්වෙන්නේ බුද්ධකාලීන භාරතීය ආගමික විශ්වාස පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.

A. ඊශ්වර නිර්මාණවාදය ප්‍රාග් බෞද්ධ යුගයේ සිටම දැඩිව මුල් බැසගෙන පැවතුනි.
B. අකිරියවාදී දර්ශනයක් ඉදිරිපත් කළේ පූර්ණ කස්සප විසිනි.
C. සප්ත පදාර්ථ වාදයක් ඉදිරිපත් කළේ පකුධ කච්චායන විසිනි.
D. චතුයාම සංවරය ජෛන සම්ප්‍රදායට අයත් ඉගැන්වීමකි.
E. මුසාවාද බිය නිසා පිළිතුරු නොදී සිටීම සංසයවාදයේ ලක්ෂණයකි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ලමය.

11. ෂට් ශාස්තෘන් අතර නාස්තිකවාදි ආගමික දර්ශනයක් හඳුන්වාදෙන ලද්දේ,

(1) පූර්ණ කස්සපය.
(2) මක්ඛලී ගෝසාලය.
(3) පකුධ කච්චායනය.
(4) අජිත කේශකම්බලය.
(5) නිගණ්ඨනාථපුත්තය.

12. පහත සඳහන් ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A. මගධ රාජ්‍යය ගල්පර්වත පහකින් වටව පැවැති නිසා "ගිරිබ්බජ" නමින් ප්‍රකටය.
B. වත්සාා රාජ්‍යයේ පාලකයා උදේනි රජුය.
C. චණ්ඩ පජ්ජෝත රජු තෙරුවන් සරණ ගියේ මහා කච්චාන තෙරුන්ගෙන් දහම් අසාය.
D. උදේන රජු තෙරුවන් සරණ ගියේ පිණ්ඩෝල භාරද්වාජ තෙරුන්ගෙන් දහම් අසාය.
E. බුදුන් වහන්සේ විසිපස් වසක් කෝසල රාජ්‍යයේ වස් විසූහ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි.
(5) A, B, C, D සහ E යන සියල්ලමය.

13. බුද්ධකාලීන භාරතයේ දේශපාලන ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය අතිශයින් සංකීර්ණව පැවතුණි. ඇතැම් රාජ්‍ය රාජාණ්ඩු වශයෙන් ක්‍රියාත්මක වූ අතර ඇතැම් රාජ්‍ය ගණතන්ත්‍ර රාජ්‍ය වශයෙන් පැවැතුණි. මෙසේ පැවැති ගණතන්ත්‍ර රාජ්‍ය අතුරෙන් ප්‍රබල රාජ්‍යයක්ව පැවැතියේ,

(1) වජ්ජි රාජ්‍යයයි. (2) මල්ල රාජ්‍යයයි. (3) කෝසල රාජ්‍යයයි.
(4) කාසි රාජ්‍යයයි. (5) අවන්ති රාජ්‍යයයි.

14. බුද්ධකාලීන භාරතීය සමාජය නාගරීකරණය වීමේ ප්‍රතිඵලයක් නොවන කරුණු ඇතුළත් වරණය තෝරන්න.

(1) සුරාසල් හා ගණිකා වෘත්තිය බිහිවීම.
(2) නව වාණිජ ප්‍රජාවක් බිහිවීම.
(3) වෙළඳ නගර නිර්මාණය වීම.
(4) නගරාශ්‍රිත ජනගහන වර්ධනය සීමාවීම.
(5) යුද ගැටුම් වර්ධනය වීම.

15. බුද්ධකාලීන භාරතයේ වාණිජකරණය හා නාගරීකරණය මුල්කොට ගෙන ඇති වූ සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා බලපාන ලද එක් ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) දේව නිර්මාණවාදය පදනම් කරගත් බ්‍රාහ්මණ ඉගැන්වීම් මගින් හඳුන්වා දුන් ස්වධර්ම සංකල්පය මැනවින් ක්‍රියාත්මක වීමයි.
(2) වහල් සේවයට එරෙහිව කුල හීනයන්ගේ නැගී සිටීමයි.
(3) නව සිටුවර පන්තියක් බිහිවී වෙළඳපොළ පදනම් කරගෙන ආර්ථිකය කළමනාකරණය කිරීමයි.
(4) ශ්‍රමණ සම්ප්‍රදාය විසින් බ්‍රාහ්මණ ඉගැන්වීම් දැඩි ලෙස විවේචනය කිරීමයි.
(5) මත්ස්‍ය න්‍යාය මගින් බලවත් රාජ්‍ය කුඩා රාජ්‍ය යටත් කරගෙන පාලන ප්‍රදේශ පුළුල් කර ගැනීමයි.

16. කෘෂි කර්මාන්තය දැහැමි ජීවනෝපායක් ලෙස අගය කරන බුදු සමය පාලකයා විසින් ගොවීන්ට බීජ ආදී අවශ්‍ය පහසුකම් සපයා දීමෙන් අනුග්‍රහය දැක්විය යුතු බව පැවසෙන්නේ,

(1) කූටදන්ත සූත්‍රයේ ය. (2) කසී භාරද්වාජ සූත්‍රයේ ය. (3) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.
(4) චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය. (5) මහාලි සූත්‍රයේ ය.

17. යහපත් කොට යෙතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි
....................... ..............

යනාදි පද්‍යයෙන් විස්තර වන බුදු ගුණය කුමක් ද?

(1) සත්ථා (2) සුගත (3) භගවා
(4) අරහං (5) සම්මා සම්බුද්ධ

18. "බුදුරජාණන් වහන්සේ" ලෞකික ආසා නැමති ගිනිගත් නිවෙස තුළ ඇවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නාවූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නැමැති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නාවූත් පියෙකු බඳුය. මෙලෙස බුදුන් වහන්සේ ඇගයීමට ලක් කළේ,

(1) ජර්මන් ජාතික මැක්ස් මුලර් ය. (2) බර්ට්‍රන්ඩ් රසල් ය.
(3) මහාචාර්ය ලක්ෂ්මී නරසු ය. (4) මහාචාර්ය සෝන්ඩර්ස් ය.
(5) මහාචාර්ය රීස් ඩේවිඩ්ස් ය.

19. බෞද්ධ සාහිත්‍යයෙහි පරමාදර්ශී ගිහි පැවිදි ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳ තොරතුරු අනාවරණය වේ. ඒ අතර "ඇදහිය හැකි කතා ඇති උපාසිකාවන්" අතර අග්‍ර වූයේ,

(1) විශාඛා මහෝපාසිකාවයි. (2) ඛුජ්ජුත්තරා උපාසිකාවයි.
(3) සුමනා සිටුදේවියයි. (4) නකුල මාතාවයි.
(5) කෝසල මල්ලිකා උපාසිකාවයි.

20. බුද්ධකාලීන භාරතයේ පැවැති ආගමික මතවාද කිහිපයක් පහත දැක්වේ.

A. නාස්තිකවාදය
B. සංසයවාදය
C. ඊශ්වර නිර්මාණවාදය
D. පරම අවිහිංසාවාදය
E. පුබ්බේකත හේතුවාදය

මෙම මතවාද අතරින් පුද්ගල ස්වාධීනත්වයට, ස්වාමිත්වයට හා ස්වච්ඡන්දතාවට බාධා පමුණුවන ඉගැන්වීම් දෙකක් ඇතුළත් වර්ණය වන්නේ,

(1) A සහ B ය. (2) B සහ C ය. (3) C සහ D ය.
(4) D සහ E ය. (5) C සහ E ය.

21. සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ ඊශ්වර නිර්මාණවාදී අදහස ප්‍රතික්ෂේප කරන බුදු දහම ''සමාජ ප්‍රභවය හා විකාශය'' කාලීන සමාජ අවශ්‍යතා මුල්කරගෙන පටිච්ච සමුප්පන බව පැවැසෙන්නේ,

(1) දී.නි. අග්ගඤ්ඤ සූත්‍රයේ ය. (2) දී.නි. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
(3) අ.නි. අත්තකාර සූත්‍රයේ ය. (4) අ.නි. කාලාම සූත්‍රයේ ය.
(5) අ.නි. අධම්මික සූත්‍රයේ ය.

22. පරමාදර්ශී රාජ්‍ය පාලනය පිළිබඳව ඉතා වැදගත් තොරතුරු අඩංගු ''චක්කවත්ති සීහනාද'' සූත්‍රයට අනුව සක්විති රජතුමා විසින් තමා යටතට පත්වන අසල්වැසි රාජ්‍ය පාලකයන්ට දෙනු ලබන උපදේශය වන්නේ,

(1) දිළිඳුකම පිටු දැකීමට ක්‍රියාකළ යුතු බවයි.
(2) පංචසීල ප්‍රතිපදාවෙහි පිහිටා රාජ්‍ය පාලනය සිදුකළ යුතු බවයි.
(3) සිය රාජ්‍යයෙහි අපරාධ මර්දනයට ක්‍රියාකළ යුතු බවයි.
(4) පක්ෂි උරග සිවුපාවුන්ට දැහැමි රැකවරණය සැලකිය යුතු බවයි.
(5) රාජ්‍යත්වය පිය යුතු උරුමයෙන් හිමි විය යුතු බවයි.

23. සචේතනිකව සිදු කරනු ලබන ''හොඳ නරක'' ක්‍රියාවන්ගේ විපාකය කර්තෘ වෙත පැවරීමට නම් එම ක්‍රියාව කිරීම පිණිස ඔහුට,

(1) විශ්වාසයක් තිබිය යුතුය. (2) ආශාවක් තිබිය යුතුය. (3) ස්වච්ඡන්දතාවක් තිබිය යුතුය.
(4) වගකීමක් තිබිය යුතුය. (5) චේතනාවක් තිබිය යුතුය.

24. පහත සඳහන් ප්‍රකාශ අතරින් බෞද්ධ ඉගැන්වීම්වලට අනුව සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) නීති ගරුකත්වය අපරිහානිය ධර්මයක් ලෙස බුදු දහමේ දැක්වේ.
(2) නීති ගරුකත්වයේ අවශ්‍යතාව ශික්ෂාපද පැනවීමෙන් පැහැදිලි වේ.
(3) අපරාධ වැළැක්වීමේ එකම පිළියම දඬුවම නොවේ.
(4) අපරාධවලට හේතු සෙවීමට වඩා ඒවා මර්ධනය කළ යුතුය.
(5) සමාජ සම්මතයක් වූ නීතිය නොඉක්මවා ක්‍රියා කළ යුතුය.

25. පරිසරය පිළිබඳ බුදුසමයේ අවධානය පැහැදිලි කෙරෙන ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. රුක් රෝපණය හා උයන් ඉදිකිරීම දිවා රාත්‍රි පිං වැඩෙන පිංකමය.
B. ජලයෙහි මළ මූත්‍ර කිරීම හා ජලයට කෙළ ගැසීම භික්ෂූන්ට ඇවතකි.
C. කෙලෙස් නැමැති වනය සිඳින්න ගස් වැල් නොසිඳින්න.
D. නිල් තණ මත මළමූත්‍ර කිරීම, කෙළ ගැසීම භික්ෂූන්ට ආපත්තියකි.
E. ගස්වැල් සිඳීම හා සියලු ආකාරයේ පැළවෙන බීජ සිඳීම භික්ෂූන්ට අකැපය.

ඉහත ප්‍රකාශ අතරින් පරිසර සංරක්ෂණයෙහිලා අනුබල දෙන කරුණු ඇතුළත් වඩාත් නිවැරදි වර්ණය තෝරන්න.

(1) A පමණි. (2) A සහ B පමණි. (3) A, B සහ C පමණි.
(4) A, B, C සහ D පමණි. (5) A, B, C, D සහ E යන සියල්ලමය.

26. “අගරීතෝ, අමුච්ජිතෝ, අනජ්ඣාපන්නෝ, ආදීනව දස්සාවි, නිස්සරණ පඤ්ඤාය” යන පාරිභාෂිත වචනවලින් විග්‍රහ වන්නේ,

(1) ධනය ඉපයීම පිළිබඳවයි.
(2) ධන සංරක්ෂණය පිළිබඳවයි.
(3) ධනය ආයෝජනය පිළිබඳවයි.
(4) ධන කළමනාකරණය පිළිබඳවයි.
(5) ධනය පරිභෝජනය පිළිබඳවයි.

27. සිඟාලෝවාද සූත්‍රයෙහි එන සදිසා වන්දනය තුළින් නිරූපිත අන්‍යෝන්‍ය යුතුකම් හා වගකීම කිහිපයක් පහත දැක්වේ.

A. මැනවින් හික්මවීම.
B. මැනවින් ඇහුම්කන් දීම.
C. පවින් වැළැක්වීම.
D. යහපතෙහි යෙදවීම.
E. ගරු කිරීම.

ඉහත ප්‍රකාශ අතුරින් දකුණු දිසාව නියෝජනය කරන “ගුරු ශිෂ්‍ය” යුතුකම් ඇතුළත් වර්ණය තෝරන්න.

(1) A සහ B පමණි.
(2) A සහ C පමණි.
(3) A සහ D පමණි.
(4) B සහ D පමණි.
(5) B සහ E පමණි.

28. නිද්දාසීලී සභාසීලී
අනුට්ඨාතාච යෝ නරෝ
අලසෝ කෝධපඤ්ඤාණෝ
තං පරාභවතෝ මුඛං

පරාභව සූත්‍රයේ සඳහන් මෙම ගාථාවෙන් පැවැසෙන පිරිහීමේ කරුණක් නොවන්නේ,

(1) නිතර නිදන සුළු බව
(2) ස්ත්‍රීන් කෙරෙහි ලොල් බව
(3) දොඩමළු බව
(4) උත්සාහයෙන් තොර බව
(5) අලස බව

29. ගිහි සමාජයේ අභිවෘද්ධිය පිණිස මංගල සූත්‍රයේ ඉගැන්වෙන කරුණු අතුරින් පවුලක එදිනෙදා යහපැවැත්මට අදාළ කරගත හැකි ඉගැන්වීමක් නොවන්නේ,

(1) අසේවනාච බාලානං යන්නය.
(2) මාතාපිතු උපට්ඨානං යන්නය.
(3) ඤාතකානංච සංගහෝ යන්නය.
(4) නිබ්බාණ සච්චිකිරියාච යන්නය.
(5) මජ්ජපානාච සඤ්ඤමෝ යන්නය.

30. අනුන්ගේ රළු පරළු කතාත්, අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමා ම කළ, නොකළ දේ සෙවිය යුතුය.

මෙම අදහස පැවසෙන ධම්මපද ගාථාව

(1) “මධුවා මඤ්ඤති බාලෝ” යන ගාථාවයි.
(2) “සහස්සම්පි චේ වාචා” යන ගාථාවයි.
(3) “න පරේසං විලෝමානි” යන ගාථාවයි.
(4) “සුකරානි අසාධූනි” යන ගාථාවයි.
(5) “ජයං වේරං පසවති” යන ගාථාවයි.

31. “ශ්‍රෝණවත්පු ප්‍රදේශයට” වැඩම කොට ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන්ගත කිරීමට කටයුතු කරමින් ධර්මදූත සේවාවේ යෙදෙන ලද්දේ,

(1) කොණ්ඩඤ්ඤ තෙරුන් වහන්සේ ය.
(2) සැරියුත් තෙරුන් වහන්සේ ය.
(3) මුගලන් තෙරුන් වහන්සේ ය.
(4) පුණ්ණ තෙරුන් වහන්සේ ය.
(5) මහා කාශ්‍යප තෙරුන් වහන්සේ ය.

32. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස නොසැලකිය හැකි කරුණ කුමක් ද?
   (1) නව රට සසුන් පිහිටුවීමයි.
   (2) ථෙරවාදී හා මහාසාංඝික ලෙස භික්ෂූන් නිකාය දෙකකට බෙදීයාමයි.
   (3) භික්ෂු විනය කර්ම කිරීම නැවත ආරම්භ වීමයි.
   (4) කථාවත්ථුප්‍රකරණය සම්පාදනය කිරීමයි.
   (5) අභිධර්ම පිටකය සම්පූර්ණ වීමයි.

33. "තේජෝ බල පරාක්‍රමයෙන් යුතුව රජ කළ ලක්ෂ සංඛ්‍යාත රජදරුවන්ගෙන් ගැවැසීගත් ලෝක ඉතිහාසය නැමැති ගගන තලයෙහි අශෝක දීප්තිමත් තාරකාවක් ලෙස විරාජමාන වෙයි." සංක්ෂිප්ත ලෝක ඉතිහාසයක් රචනා කළ H.G.වේල්ස් අශෝක රජු දුටු අයුරුයි. එතුමා පිළිබඳ සාවද්‍ය කරුණ තෝරන්න.
   (1) තෙවන ධර්ම සංගායනාවට දායකත්වය හා රාජානුග්‍රහය ලබා දීමයි.
   (2) වෙහෙර විහාර අසූහාර දහසක් ඉදිකිරීමයි.
   (3) විනය විභාෂා ශාස්ත්‍ර හා උපදේශ ශාස්ත්‍ර නම් කෘති තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක තැන්පත් කර මහා සෑයක් ඉදිකිරීමයි.
   (4) ධර්මදූත කණ්ඩායම් නමයක් පිටත් කර නවරට සසුන් පිහිටුවීමයි.
   (5) ධර්මමහාමාත්‍ර නම් නිලධාරීන් පත් කර බුදු දහමේ ව්‍යාප්තිය සිදු කිරීමයි.

34. භාරත දේශයේ චිර ප්‍රසිද්ධියට පත් ථෙරවාද හා මහායාන සම්ප්‍රදායන්ට අයත් බෞද්ධ විශ්ව විද්‍යාල රැසකි. ඒ අතර ක්‍රි.ව. 475 – 775 අතර කාලය තුළ වලභි විශ්ව විද්‍යාලය ආරම්භ කර ඇත්තේ,
   (1) ශක්‍රාදිත්‍ය රජු විසිනි.
   (2) පාල රාජවංශයට අයත් ධර්මපාල රජු විසිනි.
   (3) ගෝපාල රජු විසිනි.
   (4) මෛත්‍රක රජ පරපුරේ රජවරුන් විසිනි.
   (5) බුද්ධගුප්ත රජු විසිනි.

35. ප්‍රාග් මහින්ද යුගයේ ලක්දිව විදේශජ ආගම් හා දේශජ ආගමික ඇදහිලි පැවැති බවට මහා වංශය ආදී වූ මූලාශ්‍රයන්ගෙන් තොරතුරු අනාවරණය වේ. එම බොහෝ ආගම් වලට හා බොහෝ ආගමික ඇදහිලිවලට අනුග්‍රහය දැක් වූ ශ්‍රී ලාංකේය පාලකයා වන්නේ,
   (1) දේවානම් පියතිස්ස රජතුමාය.
   (2) වට්ටගාමිනී අභය රජතුමාය.
   (3) දුටුගැමුණු රජතුමාය.
   (4) ගිරිකණ්ඩශිව රජතුමාය.
   (5) පණ්ඩුකාභය රජතුමාය.

36. මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාද්වීපයට බුදු දහම රැගෙන වැඩම කිරීමෙන් පසුව පැවැති ආගමික ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුව හැඩ ගැසී වර්ධනය වූ බවට තොරතුරු මූලාශ්‍ර ග්‍රන්ථවලින් අනාවරණය වේ. මේ සඳහා දැක්විය හැකි නිදසුනක් නොවන්නේ,
   (1) පණ්ඩුකාභය රජු ජෝතිය නම් නිගණ්ඨයාට ගෘහයක් හා කුම්භාණ්ඩ නම් නිගණ්ඨයාට දෙවොලක් ඉදිකර දී පුදසුන් පැවැත්වීමයි.
   (2) ලාංකිකයන් අර්ථවත් බෝධි වන්දනාවට නැඹුරුවීමයි.
   (3) කුශලකර්ම සිදුකොට මළවුන්ට පිං දීමයි.
   (4) කුශලකර්ම සිදුකොට දෙවියන්ට පිං අනුමෝදන් කිරීමයි.
   (5) ස්තූප, ප්‍රතිමා වැනි ස්මාරක ඉදිකොට වන්දනයට යොමු වීමයි.

37. මහින්දාගමනයත් සමඟම බ්‍රාහ්මණ පූජකයින් සතුව පැවැති රාජ්‍ය උපදේශකත්වය බෞද්ධ භික්ෂුව සතු වුණි. ඒ අනුව දුටුගැමුණු රජුගේ රාජ්‍ය උපදේශකයා වූයේ,
   (1) මිහිඳු මහරහතන් වහන්සේය.
   (2) ගෝධගත්ත තිස්ස හිමියන්ය.
   (3) කුපිත්කල තිස්ස හිමියන්ය.
   (4) කාලබුද්ධරක්ඛිත හිමියන්ය.
   (5) පාර්ශව හිමියන්ය.

38. මහා විහාරය හා අභයගිරි විහාරය ශ්‍රී ලංකාවේ බිහි වූ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන දෙකකි. ඒ අතර මහා විහාරය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) කාලප්‍රාසාදය, පියඟු පිරිවෙන, ගුත්තවංක පිරිවෙණ මහා විහාරයට අනුබද්ධ ආයතන වේ.

(2) ධාරණ ශක්තියෙන්, ප්‍රඥාවෙන් අගතැන්පත් බුද්ධිමත් භික්ෂූන් වහන්සේලා මහා විහාරයේ වැඩ විසූහ.

(3) කනිට්ඨ තිස්ස රජතුමා මහා විහාරයේ ප්‍රයෝජනය පිණිස ගාමිනී තිස්ස ජලාශය තැනුවේය.

(4) මූලායතන පිහිටුවා බෞද්ධ ආරාමික අධ්‍යාපනය පෝෂණය කොට ආරක්ෂා කළේය.

(5) විනය සංගායනාවක් පවත්වා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේය.

39. උපතේ සිට මරණය දක්වා සෑම වැදගත් අවස්ථාවකම නිසි චාරිත්‍ර විධි ඉටුකිරීම ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධ ජන සමාජයේ ප්‍රමුඛ ලක්ෂණයකි. ඒ අනුව පුද්ගල ජීවිතයක මුල් කාල පරිච්ඡේදයේ සිදු කරනු ලබන චාරිත්‍ර කිහිපයක් පහත දැක්වේ.

A. ඉඳුල් කට ගෑම

B. නම් තැබීම්

C. ශාස්ත්‍ර ශාලාවකට බාරදීම

D. දොරට වැඩීම

E. අකුරු කියවීම

ඉහත කරුණු අතුරින් චාරිත්‍ර ඉටු කිරීමේ අනුපිළිවෙළ ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, D, E, C ය.
(2) B, C, D, E, A ය.
(3) B, D, C, A, E ය.
(4) B, D, A, E, C ය.
(5) D, A, B, E, C ය.

40. "මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජ සැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ය." දුටුගැමුණු රජතුමා සිදුකළ ප්‍රකාශනයෙන් පැවැසෙන්නේ,

(1) ආදර්ශවත් නායකත්වයයි.

(2) විශිෂ්ට ශාස්තෘත්වයයි.

(3) නීති ගරුකත්වයයි.

(4) පුද්ගල ශක්තිය හා ස්වාධීනත්වයයි.

(5) ශාසන මාමාකත්වයයි.

41. බුදු දහම හඳුන්වාදෙන ලද සෙසු ථෙරවාදී බෞද්ධ රටවලට සාපේක්ෂව මියන්මාර් සමාජයේ සිදු වූ සුවිශේෂී වෙනසක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) බුදු දහම රාජ්‍ය ආගම බවට පත් කිරීමයි.

(2) පාලි ත්‍රිපිටකය ස්වකීය භාෂාවට පරිවර්තනය කිරීමයි.

(3) පැවැති ආගමික විශ්වාස සපුරා බැහැර කිරීමයි.

(4) තාවකාලික පැවිද්ද ක්‍රියාත්මක වීමයි.

(5) කුලභේදය නොසලකා කටයුතු කිරීමයි.

42. ථායි බුදු දහම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ක්‍රි.පූ.329 දී "නකොම් පටොම්" නගරාශ්‍රිතව බුදුදහම ව්‍යාප්තව පැවැතුණි.

(2) ක්‍රි.ව.700 දී පලම්බාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්තව පැවැතුණි.

(3) ක්‍රි.ව.11 වන සියවසේ දී අනවරත රජුගේ අනුග්‍රහයෙන් බුදු සමය ව්‍යාප්තව පැවැතුණි.

(4) ක්‍රි.ව.5 වන සියවසේ දී ප්‍රෝම් හා හිමව්ෂා නගරවල බුදුසමය ව්‍යාප්තව පැවැතුණි.

(5) ක්‍රි.ව.7 වන සියවසේ දී ද්වාරවතී රාජ්‍යයේ බුදු සමය ව්‍යාප්තව පැවැතුණි.

43. "ආගම් තුනේ රට" යන විශේෂ නාමයෙන් හැඳින්වෙන රට වන්නේ,

(1) බුරුම රටයි. (2) සියම් රටයි. (3) චීන රටයි.
(4) ජපන් රටයි. (5) ශ්‍රී ලංකාවයි.

44. 'ජපන් අශෝක', 'දෙවන අශෝක' යන විරුදාවලි නාමයන්ගෙන් හැඳින්වෙන ජපන් රාජ්‍ය පාලකයා වන්නේ,

(1) කිම්මෙයි රජුය. (4) මොනනොබේ වංශිකයාය
(2) ෂෝතෝකු තයිෂි උමයාදෝ රජුය (5) නකතොමේ වංශිකයාය.
(3) යොමෙයි රජුය

45. 'සෙන්' බුදු දහමේ ආභාෂයෙන් ජපන් සංස්කෘතිකාංග රැසක්ම බිහි වී ඇත. ඒ අතර "ඔකුම්" නමින් හැඳින්වෙන්නේ,

(1) නාට්‍ය කලාවයි. (2) රූකඩ කලාවයි. (3) මල් සැකසුම් කලාවයි.
(4) චිත්‍ර කලාවයි. (5) සටන් කලාවයි.

46. පළමුව බුද්ධ ප්‍රතිමාව මූර්තිමත් කිරීමේ ගෞරවය ලාංකීය කලාකරුවන්ට හිමිවිය යුතු බව පවසන්නේ,

(1) D.T.දේවේන්ද්‍ර මහතා ය. (2) වින්සන්ට් ස්මිත් ය. (3) පර්ෂි බ්‍රවුන් ය.
(4) ආනන්ද කුමාරස්වාමී ය. (5) හැවැල් ය.

47. ගන්ධාර බුද්ධ ප්‍රතිමාවක් හා මථුරා බුද්ධ ප්‍රතිමාවක් පහසුවෙන්ම හඳුනාගත හැකිය. ඒ අතර ගන්ධාර සම්ප්‍රදායට අයත් ප්‍රතිමා ලක්ෂණයක් නොවන්නේ,

(1) මහා කාරුණික ලීලාවයි. (2) ශාක්‍ය සිංහ ලීලාවයි. (3) ආභංග සිරුරයි.
(4) අඩවන් දෙනෙත් ය. (5) ස්වභාවික හිසකේ ය.

48. සඳකඩ පහණ පිළිබඳව විවිධ විචාරකයන් විවිධාකාරයෙන් මතවාද පළකර ඇත. ඒ අතර "සඳකඩ පහණ දොරටුව සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනිත්" ලෙස දක්වන්නේ,

(1) සෙනරත් පරණවිතාන මහතා ය. (4) විනීවිතාරණ මහතා ය.
(2) H.C.P.බෙල් මහතා ය. (5) විලියම් ඊ වෝඩ් මහතා ය.
(3) D.T.දේවේන්ද්‍ර මහතා ය.

49. සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යයේ පෝෂණයට මෙන්ම නාට්‍ය කලාවේ පෝෂණයට බුදු දහමේ ආභාෂය ලැබී ඇත. ඒ අනුව දඹදෙණි යුගයේ දෙවෙනි පැරකුම්බා රජු විසින් රචිත 'කව්සිළුමිණට' පදනම් ව ඇත්තේ,

(1) මඛාදේව ජාතකයයි. (2) සස ජාතකයයි. (3) කුස ජාතකයයි.
(4) සත්තුභත්ත ජාතකයයි. (5) ගුත්තිල ජාතකයයි.

50. චිත්‍ර, මූර්ති, කැටයම්, ගෘහ නිර්මාණ ආදී වූ බෞද්ධ කලා නිර්මාණ තුළින් අරමුණු රැසක් සාධනය වේ.

A. බෞද්ධ සාරධර්ම ජනතාව අතරට රැගෙන යන ප්‍රබල මාධ්‍යයක් වීම.
B. පොදු ජන මනසට ධාර්මික සුවයක් ලබා දීම.
C. හෙළ සංස්කෘතියේ ප්‍රෞඪත්වය ලොවට හෙළි කිරීම.
D. දිගු ඉතිහාසයකට උරුමකම් කියන ජාතියක් ලෙසට ලාංකිකයන් පත්වීම.
E. දෙස් විදෙස් සංචාරක ක්ෂේත්‍රයේ අභිවෘද්ධියට හේතු වීම.

යන කරුණු නිවැරදි වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) A, B හා C ය.
(4) A, B, C හා D ය. (5) A, B, C, D හා E ය.

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2024
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2024

| | | |
|---|---|---|
| 13 ශ්‍රේණිය | 45 S II | බෞද්ධ ශිෂ්ටාචාරය - II<br>Buddhist Civilization - II |

කාලය : පැය තුනයි
Time : Three hours

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

(1). (i) සන්‍යාසි ආශ්‍රමයට අයත් කාර්යයන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 02 යි)

(ii) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන "ආපද්ධර්ම" කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි)

(iii) බ්‍රාහ්මණ ආගමික සම්ප්‍රදාය තුළ කාන්තාව පුරුෂාධිපත්‍යයට යටත් කොට පාලනය කළ බවට සාධක හතරක් ගෙන හැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) පූර්ණකස්සප ශාස්තෘවරයාගේ අකිරියවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න. (ලකුණු 05 යි)

(v) අජිත කේසකම්බලගේ ආගමික ඉගැන්වීම් මගින් සමාජ සදාචාරයට සිදුවන අහිතකර බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(2). (i) බුදු රජාණන් වහන්සේ "සම්මා සම්බුද්ධ" නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බුදු රජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iii) බුද්ධ කාලීන භාරතීය සමාජය නාගරීකරණයට ලක්ව තිබූ බවට සාධක හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 04 යි)

(iv) බුදු රජාණන් වහන්සේගේ ආදර්ශවත් නායකත්වය ප්‍රකට කෙරෙන අවස්ථා හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 05 යි)

(v) අනේපිඬු සිටුතුමාගේ චරිත කතාව ඇසුරින් ගත හැකි ආදර්ශ හතරක් ගෙනහැර දක්වන්න. (ලකුණු 06 යි)

(3). (i) "මධුවා මඤ්ඤති බාලෝ" යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (3)(i) හි ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන භෝග විනාශ මුඛ හය කෙටියෙන් පහදන්න. (ලකුණු 04 යි)

(iv) පුද්ගලයාගේ පරිහානියට හේතුවන පරාභව සූත්‍රාගත කරුණු පහක් කෙටියෙන් දක්වන්න. (ලකුණු 05 යි)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන මංගල සූත්‍රාගත කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් කරන්න. (ලකුණු 06 යි)


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## II කොටස

(4). (i) රටක ආර්ථික සමෘද්ධිය විෂයයෙහිලා දේශපාලන මැදිහත්වීම කෙසේ සිදුවිය යුතුදැයි බෞද්ධ දේශපාලන මූලධර්ම ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10 යි)

(ii) හොඳ නරක ක්‍රියා තමා විසින්ම තීරණය කරගත හැකි ආකාරය බෞද්ධ සදාචාර නිර්ණායක ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(5). (i) වර්තමාන සමාජ ප්‍රශ්න හමුවේ සරල දිවි පැවැත්මක ඇති ප්‍රායෝගික වැදගත්කම බෞද්ධ සාරධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(ii) පරිසර සංරක්ෂණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල කාලීන වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(6). (i) ශාසන චිරස්ථිතියට හා ව්‍යාප්තිය පිණිස ධර්ම සංගායනාවලින් ලැබුණ පිටිවහල ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) ධර්මාශෝක රජතුමාගේ ශාසනික මෙහෙවර උදාහරණ සහිතව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(7). (i) භාරතයේ ප්‍රකට ව පැවැති පැරණි බෞද්ධ විශ්ව විද්‍යාල නම් කොට, විශ්ව විද්‍යාලවලින් සිදු වූ ධර්ම ශාස්ත්‍රීය සේවාව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) ථේරවාදී බුදු සමයේ චිර සංරක්ෂණය උදෙසා මහා විහාරයීය භික්ෂූන් ඉටු කළ මෙහෙය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(8). (i) ජපන් සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුණ දායකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විස්තර සපයන්න.

I. චතුර්විධ සුඛය

II. දඹදෙණි යුගයේ බෞද්ධ සාහිත්‍යය

III. ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා

IV. බෞද්ධ ගීත සාහිත්‍යය

(ලකුණු 05 x 2 = 10 යි)

PAST PAPERS WIKI

(10) WWW.PastPapers.WiKi (10)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න